THE BUDDHIST
ශ්‍රී ඝුන්සලෝ Temple

පෝය දින පණිවුඩය

POYA DAY MESSAGE

## නමෝ තස්ස භගවතෝ සම්මා සම්බුද්ධස්ස

<u>දුර්වල චරිත හඳුනාගෙන ශක්තිමත් චරිතයක් ගොඩ නගා ගනිමු.</u>

**සත්ත බෝ ඉමා සුජාතේ පුරිසස්ස භරියායෝ**
**කතමා සත්ත වධක සමා, චෝරි සමා, අය්‍යා සමා,**
**මාතු සමා, භගිනි සමා, සඛි සමා, දාසි සමා**
( අංගුත්තර නිකායේ සත්ත භරියා සූත්‍රය ඇසුරෙනි.)

කාරුණික පින්වත,

2007 වර්ශය අවසන් විය. 2008 වර්ශය උදා විය. නව වර්ශය උදාවූ මේ මොහොතේ මෙම දහම් පත්‍රිකාවෙන් අපේක්ෂා කරන්නේ සමාජය තුල පවත්නා දුර්වල චරිත හඳුනාගෙන එම චරිත ශක්තිමත් කර ගැනීමයි.

ඉහත සඳහන් කලේ අංගුත්තර නිකායේ සත්තක නිපාතයේ සත්ත භරියා සූත්‍රයේ සඳහන් කොටසකි. එහි සරල අදහස මෙසේය. සුජාතාවෙනි, පුරුෂයාට භාර්යාවරු සත් දෙනෙක් වෙති. කිනම් සත් දෙනෙක්ද? වධක, සොර, ආර්ය, මව, සොයුරිය, යෙහෙළිය, දාසිය යනු එම භාර්යාවරු සත් දෙනා වෙති.

දිනක් බුදුන් වහන්සේ අනේ පිඩු මහ සිටාණන්ගේ නිවසට වැඩම කළහ. ඒ වන විට සිටු ගෙදර මහ ඝෝෂාවකි. තථාගතයන් වහන්සේ ඝොෂා වලට කැමති නැත. ඒ නිසා සිටු තුමාගෙන් ඊට හේතු විචාලහ. එහිදී අනේ පිඩු සිටාණන් මහත් ලැජ්ජාවෙන් කියා සිටියේ ස්වාමිණි ඉතා පොහොසත් කුල ගෙයකින් සුජාතා නම් දියණියක් අපේ පුතණුවන්ට අවාහ කර දුන් බවත් ඇය මටවත්, මගේ ස්වාමි දුවටවත්, ඇයගේ ස්වාමියාටත් කිසිදු ගරු සරුවක් නැත. ඔබ වහන්සේ වැඩම කල අවස්ථාවේදීවත් ඇයගේ නිහඬතාවයක් නැත. බුදුන් වහන්සේ මෙහිදී මෙහිදී එම දුර්වල ස්ත්‍රී චරිතය නිමිති කර ගෙන සමස්ථ ස්ත්‍රී වර්ගයාගේත්, සමස්ථ සමාජයේත් පවත්නා දුර්වල චරිත ශක්තිමත් කිරීමේ අරමුණින් සිටුතුමණි ඇය මෙතනට කැඳවාගෙන එන ලෙස වදාලහ. සිටුතුමා තම නීතියෙන් බැඳුන් දියණියන් වන සුජාතාව කැඳවාගෙන ආහ. තථාගතයන් වහන්සේ ඇයගෙන් ප්‍රශ්න කලේ සුජාතවෙනි භාර්යාවරු සත්දෙනෙක් සිටින බව දනීද? නොදනාමි යනු ඇගේ පිළිතුර විය. ඔවුන් හඳුනා ගැනීමට කැමතිද? කැමතියයි කී කල මේ භාර්යාවරු සත් දෙනාගේ චරිත ලක්ෂණ හඳුන්වා දුන් සේක.

උඳුවප් පුර පසලොස්වක දිනය ලංකාවේ කාන්තාවන්ට සුවිශේෂී දිනයකි. එවන් දිනෙක මේ සූත්‍රයේ සඳහන් දුර්වල කාන්තා ලක්ෂන හඳුනගෙන ඒවායින් මිදී ශක්තිමත් චරිතයක් ගොඩනගා ගැනීමට උත්සාහවත් විය යුතුයි. කින්තාවන්ට පමණක් නොව පුරුෂ පක්ෂයටත් තම දුර්වල චරිත හඳුනාගෙන ශක්තිමත් වීමට මෙම සූත්‍රය ඉතා වැදගත් වෙයි.

මෙම සූත්‍රය සුදහන් කරන පරිදි නරක භාර්යාවන් තුන් දෙනෙක් වෙති. වධක භාර්යාව, චෝර භාර්යාව සහ ඇර්ය භාර්යාව යන මේ තිදෙනා තම දුර්වල චරිත ලක්ෂන හඳුනා නොගෙන මිය ගියහොත් අපා ගත වන බව මේ සූත්‍රයේ කියයි. ඒ දුර්වල ලක්ෂණ හඳුනාගෙන ඉන් මිදීමට ක්‍රියා කලහොත් දෙව්ලොව යන බවද දක්වා ඇත.

අපි මුලින්ම ස්වාමි පුත්‍රයාට වධ කරන වධක භාර්යාවගේ ලක්ෂණ හඳුනා ගනිමු.

දූෂිත සිත් ඇති බව ( පදුට්ඨ චිත්තා)
හිතානුකම්පා නැති බව ( අහිතානුකම්පිනී)
පරපුරුෂයන් කෙරෙහි ඇලීම ( අඤ්ඤෙසු රත්තා)
ස්වාමියා ඉක්මවා යෑම ( අතිමඤ්ඤතේ පතිං)
ධනය සම්බන්ධයෙන් නිතර කරදර කිරීම ( ධනය කීතස්ස වධාය උස්සුකා)

යනු වධක භාර්‍යාවක් සතු ලක්ෂනයෝය. යම් ස්වාමියෙක් ස්වාමි දුවක් විවාහ කරගන්නේ සතුටින් ජීවත් වීමේ අරමුණෙනි. නමුත ඉහත කී ලකෂණ ඇති ස්වාමි දුවක් තමාට ලැබුණොත් එය මහා වධයකි.

සමාජයේ ජීවත් වන බොහෝ භාර්යාවරු නිරන්තරයෙන්ම ගෘහ පරිසරය තුල ජීවත් වන්නේ දූෂිත සිත් ඇතිවයි. විවාහ වන්නට පෙර ඇයගේ මුහුණේ දැකුම්කළු බව විවාහයෙන් පසුව නැතිවී යයි. එය දුර්වල ලක්ෂණයකි.

ගිහි ජීවිතය තුල විවිධ ගැටළු ඇති බව අපි දනිමු. නමුත් ඒවාට සාධාරණ විසඳුම් සොයාගතහොත් දූෂිත නොවූ සිතකින් ජීවත් විය හැකිය.

විවාහ ජීවිතයකදී සිදුවන්නේ පුදගලයින් දෙදෙනෙක් එක් පුද්ගලයෙකු වීමයි. එහිදී සිත් දෙකක් එක සිතක් බවට පත්වෙයි. එසේ නොමැති අය නිරන්තරයෙන්ම ස්වාමි පුත්‍රයාට අහිතවත්ව ක්‍රියා කරති. එසේම තම ස්වාමිපුත්‍රයා යනු තමා වෙනුවෙන්ම නිරන්තරයෙන්ම දුක් විඳින පුද්ගලයෙකි. ඔහුට අනුකම්පා කළ යුතුයි. නමුත් බොහෝ ස්වාමි දූවරු තම සැමියාට කිසිදු අනුකම්පාවක් නොදක්වති.

හොඳ භාර්යාවක් නම් ඇය ඇල්ම දැක්විය යුත්තේ තම ස්වාමි පුත්‍රයා කෙරෙහිය. නමුත් බොහෝ ස්වාමි දියණිවරු ඉතා කුළුපග බවක් දක්වන්නේ වෙනත් සවාමි පුරුෂයින් කෙරෙහිය. හොඳ චරිතයක් ඇති ස්වාමි දුව කිසිදු ආකාරයකින් තම සැමියා ඉක්මවා නොයයි. නමුත් බෙහෝ ස්වාමිදුවරුන් හැම ආකාරයෙන්ම තම ස්වාමිපුත්‍රයා ඉක්මවා යෑමට කටයුතු කරති.

ගිහි ජීවිතයක් ගත කිරීමට ධනය අවශ්‍යය. නමුත් ඒ ධනය ඉපයීමේදී අනවශ්‍ය කරදර කරන ස්වාමි දූවරු අප සමාජයේ නිතර දකින්නට ලැබේ. මෙම දුර්වල චරිත ලක්ෂණ 5ම යමෙකුට තිබේ නම් ඇය වධක භාර්යාවකි. ඒ නිසා එවැනි චරිත ලක්ෂණ වලින් මිදි ක්‍රියා කිරීමට මේ පෝය දිනයේදී අදිටන් කර ගත යුතුය.

දෙවන නරක භාර්යාව චෝර භාර්යාවයි. ඇයගේ නරක චරිත ලක්ෂණය හැටියට සූත්‍රය දක්වන්නේ ස්වාමි පුත්‍රයා ගේ සොරකම් කිරීමයි. සැමියා දුක් මහන්සියෙන් උපයන දේ සොරකම් කිරීම භාර්යාව සතු යුතුකමක් නොවේ. අපහාතු මිජ්ජති යනුවෙන් දක්වන්නේ ස්වාමි පුත්‍රයන්ගේ දේ සොර සිතින් ගැනීමයි. එවැනි භාර්යාවරු සමාජයේ ඕනෑ තරම් දැකිය හැකිය. එවැනි අය වෙත්නම් මින් පසු එවැනි දේ නොකිරීමට අදිටන් කර ගත යුතුය.

තෙවැනි නරක භාර්යාව ආර්ය භාර්යාවයි. මෙහි වචන අර්ථයෙන් ගත් කල පෙනෙන්නේ හොඳ බවකි. ආර්ය යනු උතුම් යන තෙරුම ඇති බැවිනි. නමුත් මේ සූත්‍රය කියන පරිදි ආර්ය භාර්යාව යනු ගෙදර අධිපතිනිය වශයෙන් ඉතා ඉහලින් කටයුතු කරණ තැනැත්තියයි. ගෙදර ප්‍රධානියා විය යුත්තේ ස්වාමි පුරුෂයාය. එම බාර්යාවගේ ලක්ෂණ ගැන කියන මෙම සූත්‍රය ඇය වැඩට අකමැති බව කියයි( අකම්ම කිමා) අලසය ( අලසා) බොහෝකොට කෑම් බීම් අවශ්‍යය ( මහග්ඝසා ) පරුෂය( ඵරුසා) චණ්ඩිය ( චණ්ඩී) දැරුණු වචන කථා කරයි ( දුරුත්ත වාදිනි ) තම සැමියාට දැරිය හැකි උත්සාහයට වඩා වැඩියෙන් ප්‍රාර්ථනා කරයි( උට්ඨායකානං අසභුය වන්තකී ) මෙවැනි ගති ලක්ෂණ ඇති බිරිඳ ළමාතැනී කෙනෙකු මෙන් ගත කරන ජීවිතය නොගැලපෙයි. මෙවැනි චරිත ලක්ෂණ ඇති අය වෙත්නම් 2008 වර්ශයේදීවත් මෙවැනි චරිත ලක්ෂණ වලින් මිදීමට කටයුතු කල යුතුයි.

සූත්‍රයෙහි සඳහන් වන ඉතා හොඳ භාර්යාවරු හතර දෙනෙක් වෙති. ස්වාමියාට මවක් මෙන් ක්‍රියා කරන මාතු භාර්යාව , සොහොයුරියක් සේ ක්‍රියා කරන භගිනි භාර්යාව යෙහෙළියක් සේ ක්‍රියා කරන සඛි භාර්යාව දාසියක් සේ ක්‍රියා කරන දාස භාර්යාව යන සිවු ඉතා හොඳ භාර්යාවරුය. එම භාර්යාවන් මරණින් මතු දෙව් ලෝ යන බව කියයි.

සාමියාට තම ස්වාමි දියණිය මවක් මෙන් පෙනේ නම් ඇය මාතු භාර්යාව නම් වේ. ඇයගේ චරිත ලක්ෂණ දක්වන මෙම සූත්‍රය සැමදා ස්වාමියාට හිතානුකම්පීව වාසය කරන බව කියයි ( සබ්බදා හිතානුකම්පී ) මවක් තම පුතා ආරක්ෂා කරන්නා සේ තම ස්වාමි පුත්‍රයා ආරක්ෂා කරන බව දක්වයි. ( මාතාව පුත්තං අනුරක්ඛතේ පතිං) තම සැමියාගේ ධනය හොඳින් ආරක්ෂා කරයි ( ධනං සම්භතමස්ස රක්ඛති) තම බිරිඳ තුල මෙවැනි ලක්ෂණ ඇත්නම් ඒ සැමියා කොතරම් සතුටින් ජීවත් වේද? ඒ නිසා එම ගති ඇති භාර්යාවරු එම ලක්ෂණ ඉදිරියටත් ඊටත් වඩා හොඳින් පවත්වාගෙන යාමට අදිටන් කර ගත යුතුය.

සැමියාට තම ස්වාමි දුව පෙනෙන්නේ සොහොමුරියක් ලෙසින් නම් ඇය භගිනි භාර්යාවයි. ඇයගේ ලක්ෂණ හඳුන්වන සූත්‍රය ස්වාමියාට ඉතා ගෞරවයෙන් සලකන බව කියයි. ( සගාරවා) ලැජ්ජාශීලිව කටයුතු කරයි ( හිරිමනා) සැමියාගේ අදහසට පිටින් කටයුතු නොකරයි ( භත්තුවසානුවත්තිනී) තම බිරිඳ තුල මෙවැනි ලක්ෂණ ඇත්නම් ඒ සැමියා කොතරම් සැනසීමකින් ජීවත් වේද? මෙවැනි ගති ලක්ෂණ ඇති භාර්යාවරු තව තවත් එම ලක්ෂණ වැඩි දියුණු කර ගැනීමට උත්සාහවත් විය යුතුය.

සැමියාට තම ස්වාමි දුව පෙනෙන්නේ යෙහෙළියක් ලෙසින් නම් ඇය සඛී භාර්යාවයි. ඇයගේ චරිත ලක්ෂණ හඳුන්වාදෙන මෙම සූත්‍රය බොහො කලක් නොදුටු කෙනෙක් දුටු විට ඇති වන සතුට හා සමාන ප්‍රීතියක් තම සැමියාගේ දර්ශනයෙන් ඇතිවන බව කියයි ( පති දිස්වාන පමෝදති). කුල චාරිත්‍ර ඉටු කරයි( කෝලෙය්‍යකා) සිල්වත්ය ( සීලවතී) පතිවෘතිව ආරක්ෂා කරයි (පතිබ්බතා) තම බිරිඳ තුල මෙවැනි ගති ලක්ෂණ ඇතිනම් ඒ ස්වාමියා මොන තරම් සැනසීමකට පත්වේද ? ඒ නිසා මෙවැනි ලක්ෂණ ඇති භාර්යාවරු තව තවත් එම ගති ලක්ෂණ වැඩි දියුණු කර ගැනීමට අදිටන් කර ගත යුතුයි.

සැමියාට තම ස්වාමි දුව පෙනෙන්නේ දාසියක් ලෙස නම් ඇය දාසි භාර්යාව නම් වේ. ඇයගේ චරිත ලක්ෂණ හඳුන්වාදෙන මෙම සූත්‍රය තම සැමියා තමාට දඬුවමින් තර්ජන කොට වධ කලත් නොකිපී සිටිනා බව කියයි. ( අක්කුද්ධ සන්තා වධ දණ්ඩ තජ්ජිතා) තම සැමියාගෙන් වරදක් සිදුවුවහොත් ඊට සමාව දෙයි ( පතිනො තිතික්ඛති ) ස්වාමි පුත්‍රයාගේ වචනයට අනුව පවතියි ( භත්තුවසානුවත්තනී) මෙවන් චරිත ලක්ෂණ ඇති භාර්යාවක් වේ නම් ඇය සැමියාට මහත් සැනසුමකි. ඒ නිසා මෙවැනි චරිත ලක්ෂණ ඇති අය එම ලක්ෂණ තව තවත් වැඩි දියුණු කර ගත යුතුය.

ඉහත සඳහන් කල නරක භාර්යාවරුන් තිදෙනා එම ලක්ෂණ වලින් නොමිදී ක්‍රියා කොට මිය පරලොව ගියහොත් අපාගත වන බවත් හොඳ ලක්ෂණ ඇති භාරයාවරු හතර දෙනා මරණින් මතු දෙව්ලොව යන බවත් සූත්‍රය දක්වයි.පළතුරු අතර අඹ යනු ඉතා රසවත් පළතුරකි. නමුත් ඒ අඹ වලත් කොහු අඹ හා සීනි අඹ යනුවෙන් වර්ග දෙකක් වෙයි. මේ සූත්‍රයට අනුව මුලින් කී නරක භාර්යාවරු තිදෙනා කොහු අඹ මෙනි. කොහු අඹ කෑ මොහොතේ පටන් කරදරය. දත් අතරේ රැඳුනු කොහු ඉවත් කිරීමට සිදුවන බැවිනි. එවැනි භාර්යාවරු හැඳින්විය හැක්කේ කොහු අඹ ලෙසිනි. සීනි අඹ වලින් එවැනි කරදරයක් නැත. හොඳ භාර්යාවරු හතර දෙනාම හැඳින්විය හැක්කේ සීනි අඹ ලෙසිනි. ඒ නිසා මෙම උඳුවප් පොහෝදින මේ ධර්ම පත්‍රිකාව බලන අය කොහු අඹ නම් ඉතා ඉක්මනින් සීනි අඹයක් බවට පත්වීමට අධිෂ්ඨාන කරගත යුතුය. මේ සූත්‍රය අසා සිටි සුජාතා නම් කොහු අඹය කියා සිටියේ ස්වාමිනි මම අද පටන් දාසී භාර්යාවක් සේ ක්‍රියා කරමින් සීනි අඹයක් වන බවයි.

මෙකී ලක්ෂණ ඇති ස්වාමි පුත්‍ර වරුද අද සමාජයේ ඕනෑ තරම් දැකිය හැකිය. ඒ අනුව තම ස්වාමි දියණියට නිතරවධ කරන ස්වාමි පුත්‍රවරු දැකිය හැක. තම ස්වාමි දියණිය දුකසේ හම්බකරන වස්තුව සොරකම් කරන සොර ස්වාමි පුත්‍රවරු දැකිය හැකිය. නිරන්තරයෙන් පමණට වඩා ඉහලින් කටයුතු කරමින් තම ස්වාමි දියණිවරු අපහසුතාවයට පත්කරවන ආර්ය ස්වාමි පුත්‍ර වරු දැකිය හැක. ඒ දුර්වල ලක්ෂණ හඳුනා නෙගෙන ඒවායින් නොමිදි ක්‍රියා කලහොත් අපාගතවන බව කියයි.

ස්වාමි දියණියට තම ස්වාමි පුත්‍රයා පෙනෙන්නේ පියෙකු හැටියටයි. පියෙක් තම දියණිය රැක බලා ගන්නා ලෙස බිරිඳ ආරක්ෂා කරණ අය ඕනෑ තරම් දැකිය හැක. බිරිඳගේ ධනය හොඳින් ආරක්ෂා කරගෙන ක්‍රියා කරන ස්වාමි පුත්‍රයා මේ සූත්‍රයට අනුව පීතෘ ස්වාමිපුත්‍රයා ලෙස සිතා ගත හැකිය. එවැනි ස්වාමියෙක් ඇති බිරිඳ කොතරම් සැනසීමක් ලබාද?

ස්වාමි දියණියට තම ස්වාමි පුත්‍රයා පෙනෙන්නේ තමාගේ දෙටු සහෝදරයා ලෙසයි. තම ස්වාමි පුත්‍රයා තමාට ගරු කරයි, ලැජ්ජාශීලිව කටයුතු කරයි, ස්වාමි දියණියගේ අදහස් වලට පටහැණිව කටයුතු නොකරයි. මෙවැනි භාතෘ ස්වාමි පුරුෂයෙකු ලබන ස්වාමි දියණිය කොතරම් වාසනාවන්තද ?

ස්වාමි දියණියට තම සැමියා පෙනෙන්නේ යහළුවෙකු ලෙසිනි. ඔහු වඩාත්ම සතුටු වන්නේ තම බිරිඳ දැකීමෙනි. කුල සිරිත් ඉටු කරන සිල්වත් ස්වාමි පුත්‍රයා සමග ඇය ගත කරන ජීවිතය කොතරම් අගනේද? රවැනි ස්වාමි පුත්‍රයෙකු ලබන ස්වාමි දියණිය කොතරම් වාසනාවන්තද?

ස්වාමි දියණියට තම සැමියා පෙනෙන්නේ දාසයෙකු ලෙසට නම් ඔහු දාස ස්වාමි පුත්‍රයෙකි. සමහර සාමිභාර්යාවරු නිරන්තරයෙන් තමාට වධ තර්ජන කලත් එහිදී ඉවසීමෙන් ක්‍රියා කරයි. ස්වාමි දියණියගේ වරදක් දුටුවත් එයට සමාව දෙයි. සවාමි දියණිය ඉක්මවා නොයයි. මේ ලක්ෂණ ඇති ස්වාමි පුත්‍රයෙකු වේ නම් ඒ ස්වාමි දියණියට කොතරම් සැනසීමක්ද? මේ අනුව පැහැදිලි කර ගත යුත්තේ ස්වාමිපුත්‍රවරුන් අතරත් කොහු අඹ සහ සීනි අඹ වල ලක්ෂණ පවත්නා බවයි. මේ දහම් පත්‍රිකාව කියවන යමෙකු ලඟ කොහු අඹ ලක්ෂණ පවතී නම් නව වර්ශයේ සිට සීනි අඹයක් විමට අධිෂ්ඨාන කරගත යුතුය.

අපේ සමාජය තුල ජීවත් වන දරුවන්ද මේ කොටස් හතට ආදේශ කර ගත හැක. දෙමාපියන්ට වධ කරන, ඔවුනගේ දේ සොරකම් කරන, ගෙදර අනෙක් හැමොම යටපත් කරගෙන ක්‍රියාකරන, වධක, චෞර, ආර්ය දරුවන් දැකිය හැක. එවැනි දරුවන් ඇති දෙමාපියන්ට මොන තරම් අසහනයක්ද? ඒ නිසා මේ දහම් පත්‍රිකාව බලන එවැනි දරුවන් වෙත්නම් ඒ සියල්ලෝම කොහු අඹ ලක්ෂණ වලින් මිදීමට අධිෂ්ඨාන කරගත යුතුය.

දෙමාපියන්ට තම දරුවන් පෙනෙන්නේ තමාගේ දෙමාපියන් ලෙසය, සහෝදර සහෝදරයින් ලෙසය, යහළු යෙහෙලියන් ලෙසය, දාස දාසියන් ලෙසය. එවැනි ගති ලක්ෂණ ඇති දරුවන් එම සිනි අඹ ලක්ෂණ තව තවත් වැඩි දියුණු කර ගැනීමට උත්සාහවත් විය යුතුය.

සමාජය තුල ජීවත් වන භික්ෂූන් වහන්සේලා, පාලක පක්ෂය, සවාමිවරු, සේවකයින්, ගුරුවරුන් ආදී සෑම සමාජ ඒකකයක් තුලම මේ හොඳ හා නරක ගති ලක්ෂණ දැකිය හැකිය. ඒ නිසා අපි සියල්ලෝම මෙම සූත්‍රයට අනුව දුර්වල චරිත හඳුනාගෙන ශක්තිමත් චරිතයක් ගොඩ නැගීමට අධිෂ්ඨාන කරගනිමු.

බුදු සරණයි......

කපුගම සුගතසාර හිමි.

LAKRUHUNA
www.lakruhuna.com